# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

දැනට භාවිතයට ගන්නා නමුත් සම්පූර්ණයෙන් ක්ෂය වූ රු.62,669,598ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගතයුතු වුවත්, එසේ කර නොතිබුණි. 2012 ඔක්තෝබර් 29 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අදාල වත්කම් ප්‍රත්‍යාගණනය කරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කර තිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හඳුනානොගත් රු.1,486,820ක් වූ රැඳවුම් මුදල් වර්ෂ ගණනාවක සිට පරිශේෂව පවතින අතර, ඒවා හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර ශාඛාවේ 2006 වර්ෂයේ සිට පැවත එන, රු.3,743,217ක් වූ වර්ගීකරණය නොකළ උපචිත වියදම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ජාත්‍යන්තර ශාඛාවේ රු.2,911,912ක් වූ ලැබිය යුතු ගිණුම් සහ රු.11,603,217ක් වූ ගෙවිය යුතු ගිණුම් වර්ෂ 04 ක කාලයක සිට පැවත එන අතර එම ශේෂවල පැවැත්ම, ශේෂ තහවුරු කිරීම් මගින් සනාථ කර නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරන ලැබේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 6.5 ඡේදය | අතිකාල ගණන් ගැනීමේදී එක දිගට කරන ලද අතිකාල පැයවලින් පැයකින් හතරෙන් පංගුවට අඩු කොටස් ගණන් නොගත යුතු වුවත් ආයතනය විසින් පැයකින් හතරෙන් පංගුවට වඩා අඩු කොටස් සියල්ල අතිකාල ගණනය සඳහා යොදා ගෙන තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 751 හා 756 | ආයතනය විසින් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් පවත්වා නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයද සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.41,736,535ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,048,202ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු.42,784,737ක් විය. ඉගැන්වීම් ගාස්තු සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තවලට අදාල ආදායම ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 478ක් වූ අතර පසුගිය වර්ෂයේ ශිෂ්‍ය ලියාපදිංචිය 415ක් විය. ආයතනය පශ්චාත් උපාධි පාඨමාලා 9කට අදාලව සිසුන් 419ක් සඳහා 2012 වර්ෂයේ උපාධි පිරිනමා තිබුණු අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ සිසුන් 438කට උපාධි පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ උපදේශක වැඩමුළු 09ක් පවත්වා තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ අවශ්‍යතා මත සේවා කාලය තීරණය කර තිබියදී නියමිත වේලාවන් වලට ආයතනයේ කාර්ය මණ්ඩලයේ පැමිණීම් හා පිටවීම් සිදුවිය යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී නිලධාරීන් වැඩි ගණනක් ප්‍රමාදවී පැමිණ තිබුණු අතර පැමිණීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලන ක්‍රමය දුර්වල තත්ත්වයක පැවතුණි.

:ආ) 2011 සැප්තැම්බර් 19 දින විශ්වවිද්‍යාලය විසින් මහාචාර්යවරයෙකු සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණ කටයුතු සඳහා පත්කළ විනිසුරු වෙත කාර්ය නිමකිරීමට පෙර රු.350,000ක් 2012 ඔක්තෝබර් 19 උන ගෙවා තිබුණු අතර 2013 ජුලි මස වන විටත් අදාල කාර්ය නිම කර වාර්තාව ලබා දී නොතිබුණි.

(ඇ) 2011 නොවැම්බර් 09 දින පාලක සභාව විසින් ජාත්‍යන්තර ශාඛාවේහි හිටපු අධ්‍යක්ෂගේ පාලන දුර්වලතා හේතුවෙන් ඔහුගේ වැඩ තහනම් කළ අතර ඒ සම්බන්ධව ඔහු විසින් පවරා තිබුණු නඩුව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ජේදයේ 6.1 වගන්තිය ප්‍රකාර නීතිපති නොවිමසා පෞද්ගලික නීතිඥයින් යොදවාගෙන ඒ සඳහා රු.802,000ක වැයකර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණ.

## 5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිළබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) භාණ්ඩ හා සේවා මිල දී ගැනීම

(ඇ) කාර්ය මණ්ඩල පාලනය